(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 51.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2025 මැයි 09 සිකුරාදා පූ.භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **(වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා,** කථානායකතුමා

ගරු **(වෛද්‍ය) රිස්වි සාලි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **හේමාලි වීරසේකර මහත්මිය,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය

---

ගරු **ආචාර්ය හරිනි අමරසූරිය,** අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය

ගරු **(වෛද්‍ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා,** විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා

ගරු **අනුර කරුණාතිලක මහතා,** නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා

ගරු **සුනිල් කුමාර ගමගේ මහතා,** තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා

ගරු **කුමාර ජයකොඩි මහතා,** බලශක්ති අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,** සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **(ආචාර්ය) අනිල් ජයන්ත මහතා,** කම්කරු අමාත්‍යතුමා සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා,** අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා

ගරු **සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය,** කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **බිමල් රත්නායක මහතා,** ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ආනන්ද විජේපාල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා

ගරු **කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා

ගරු **වසන්ත සමරසිංහ මහතා,** වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **සුනිල් හඳුන්නෙත්ති මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **චතුරංග අබේසිංහ මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නාමල් කරුණාරත්න මහතා,** කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජනිත රුවන් කොඩිතුවක්කු මහතා,** වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රත්න ගමගේ මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා,** ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඇන්ටන් ජයකොඩි මහතා,** පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්ද ජයසිංහ මහතා,** කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා,** ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුගත් තිලකරත්න මහතා,** ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගමගෙදර දිසානායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුන්දරලිංගම් ප්‍රදීප් මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මුනීර් මුලාෆර් මහතා,** ජාතික ඒකාබද්ධතා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) රුවන් රණසිංහ මහතා,** සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සුනිල් වටගල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) හංසක විජේමුණි මහතා,** සෞඛ්‍ය සහ ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග වීරරත්න මහතා,** ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. සරත් මහතා,** නිවාස නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා,** කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා,** මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා,** අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන් හේමචන්ද්‍ර මහතා,** විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් හේවගේ මහතා,** වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**

ගරු **(මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**

ගරු **(වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**

ගරු **(වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**

ගරු **ජේ.සී. අලවතුවල මහතා**

ගරු **හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**

ගරු **ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**

ගරු **(ආචාර්ය) කෞශල්‍යා ආරියරත්න මෙනෙවිය**

ගරු **බී. ආරියවංශ මහතා**

ගරු **(වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**

ගරු **කේ. ඉලංකුමාරන් මහතා**

ගරු **ඔෂානි උමංගා මහත්මිය**

ගරු **ගයන්ත කරුණාතිලක මහතා**

ගරු **රවී කරුණානායක මහතා**

ගරු **නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය**

ගරු **කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**

ගරු **චමින්ද ලලිත් කුමාර මහතා**

ගරු **නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය**

ගරු **එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය**

ගරු  අජන්ත ගම්මැද්දෙගේ මහතා

ගරු  චතුර ගලප්පත්ති මහතා

ගරු  නිහාල් ගලප්පත්ති මහතා

ගරු  සමන්මලී ගුණසිංහ මහත්මිය

ගරු  අශෝක ගුණසේන මහතා

ගරු  ඩී. වී. චානක මහතා

ගරු  රුවන්තිලක ජයකොඩි මහතා

ගරු  නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු  නීතිඥ අනුරාධ ජයරත්න මහතා

ගරු  දිලිත් ජයවීර මහතා

ගරු  නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය

ගරු  ටී.කේ. ජයසුන්දර මහතා

ගරු  නීතිඥ දයාසිරි ජයසේකර මහතා

ගරු  රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා

ගරු  සුගත් වසන්ත ද සිල්වා මහතා

ගරු  (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු  තනුර දිසානායක මහතා

ගරු  ධර්මප්‍රිය දිසානායක මහතා

ගරු  නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා

ගරු  ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු  සුසන්ත කුමාර නවරත්න මහතා

ගරු  (මහාචාර්ය) සේන නානායක්කාර මහතා

ගරු  අරුණ පනාගොඩ මහතා

ගරු  නිශාන්ත පෙරේරා මහතා

ගරු  අජිත් පී. පෙරේරා මහතා

ගරු  කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු  ජී.ජී. පොන්නම්බලම් මහතා

ගරු  ලාල් ප්‍රේමනාත් මහතා

ගරු  රෝහණ බංඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් බලගල්ල මහතා

ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා

ගරු ඊ්.එම්. බස්නායක මහතා

ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු චානක මාදුගොඩ මහතා

ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා

ගරු සංජීව රණසිංහ මහතා

ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා

ගරු සුරංග රත්නායක මහතා

ගරු අසෝක සපුමල් රන්වල මහතා

ගරු තුරෛරාසා රවිකරන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු මනෝජ් රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු වරුණ ලියනගේ මහතා

ගරු දීප්ති වාසලගේ මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා

ගරු ජගත් විතාන මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**

**ගරු තිළිණ සමරකෝන් මහතා**

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**

**ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය**

**ගරු දේවානන්ද සුරවීර මහතා**

**ගරු චන්දන සූරියආරච්චි මහතා**

**ගරු අරවින්ද සෙනරත් මහතා**

**ගරු කිට්නන් සෙල්වරාජ් මහතා**

**ගරු කබීර් හෂීම් මහතා**

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**

**ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා**

**ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා**

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

චමින්ද කුලරත්න මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස් විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු පළවන නිවේදනය කරන ලදී:—

"2025 මැයි 08 දින ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා විසින් මෙම සභාවේදී මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් වාචික පිළිතුරු අපේක්ෂාවෙන් අසන ලද ප්‍රශ්නය සඳහා නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් පිළිතුරු ලබාදීමෙන් අනතුරුව, එම මන්ත්‍රීවරයා විසින් එක් අතුරු ප්‍රශ්නයක් පමණක් අසන බව ප්‍රකාශ කොට, අතුරු ප්‍රශ්නය ඇසීමෙන් පසු, ස්ථාවර නියෝග 33(1) අනුව,'32 ස්ථාවර නියෝගය යටතේ සපයනු ලබන පිළිතුරක් සම්බන්ධයෙන් යම් මන්ත්‍රීවරයෙකු විසින් අතුරු ප්‍රශ්න දෙකකට නොවැඩි සංඛ්‍යාවක් අසනු ලැබිය හැකිය' යන්න උපයෝගී කර ගනිමින් වෙනත් මන්ත්‍රීවරයෙකු විසින් එකී ප්‍රශ්නය සම්බන්ධව අතුරු ප්‍රශ්නයක් ඇසීමට උත්සාහ කිරීමේදී ඇති වූ තත්ත්වය සම්බන්ධයෙන් මෙම සභාවට පැහැදිලි කිරීමක් සිදු කිරීමට කැමැත්තෙමි.

ස්ථාවර නියෝග 32(1) අනුව 'වාචික පිළිතුරක් ඉල්ලා ඇති යම් ප්‍රශ්නයක් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයෙහි පළ වූ අවස්ථාවක, එම ප්‍රශ්නය පළ වී තිබෙන්නේ යම් මන්ත්‍රීවරයකුගේ නමින් ද, කථානායකවරයා විසින් එම මන්ත්‍රීවරයා අමතනු ලැබිය යුතු අතර, එසේ අමතනු ලැබූ මන්ත්‍රීවරයා ස්වකීය ස්ථානයෙහි නැගී සිට ප්‍රශ්නයට පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයෙහි දී ඇති අංකය සඳහන් කරමින් එය අසනු ලැබිය යුත්තේ ය.'

තවද, ස්ථාවර නියෝග 33(1) අනුව '32 ස්ථාවර නියෝගය යටතේ සපයනු ලබන එවැනි යම් පිළිතුරක් සම්බන්ධයෙන් යම් මන්ත්‍රීවරයකු විසින් අතුරු ප්‍රශ්න දෙකකට නොවැඩි සංඛ්‍යාවක් අසනු ලැබිය හැකි ය. එසේ වුව ද, එම අතුරු ප්‍රශ්න මඟින් මුල් ප්‍රශ්නයෙහි ඇතුළත් නොවන කාරණා මතු කරනු නොලැබිය යුතු අතර, වාචික පිළිතුරකින් පැන නගින යම් කාරණයක් වඩාත් පැහැදිලි කර ගැනීමේ කාර්යය සඳහා පමණක් විමසනු ලැබිය යුත්තේ ය.'

මෙහිදී 'යම් මන්ත්‍රීවරයෙකු' යනුවෙන් ප්‍රශ්නය පළ වී ඇති මන්ත්‍රීවරයා අදහස් කරනු ලබන අතර, ප්‍රශ්න දෙකකට නොවැඩි සංඛ්‍යාවක් ඇසීමට හැකි වන්නේ එම මන්ත්‍රීවරයාට පමණි.

කෙසේ වුවද, ප්‍රශ්නය පළ කර ඇති මන්ත්‍රීවරයාගේ අනුදැනුම හා අවසරය මත පමණක් වෙනත් මන්ත්‍රීවරයෙකුට අතුරු ප්‍රශ්න ඇසීමේ සම්ප්‍රදායක් පවතින අතර, එම අවස්ථාවේදී වෙනත් මන්ත්‍රීවරයෙකු විසින් අතුරු ප්‍රශ්නයක් ඇසීමට උත්සාහ කරන ලද්දේ ප්‍රශ්නය අසන ලද මන්ත්‍රීවරයාගේ අනුදැනුමකින් හා අවසරයකින් තොරව වූ බැවින් එම අවස්ථාවේදී අතුරු ප්‍රශ්නය ඇසීම සඳහා අදාළ මන්ත්‍රීවරයාට ඉඩ ප්‍රස්ථාව ලබා නොදුන් බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි."

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ආරක්ෂක අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින ආයතන සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් 2023 වර්ෂය සඳහා ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් —

(i) 2021 වර්ෂය සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ වාර්ෂික වාර්තාව;

(ii) 2022 වර්ෂය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ වාර්ෂික වාර්තාව;

(iii) 2023 වර්ෂය සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(iv) 2023 වර්ෂය සඳහා ජාතික ලොතරැයි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව; සහ

(v) 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ වාර්ෂික වාර්තාව

ඉදිරිපත් කර, එම වාර්තා ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් —

(i) 2023 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව;

(ii) 2023 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛව රසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව;

(iii) 2023 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්; සහ

(iv) 2023 වර්ෂය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව

ඉදිරිපත් කර, එම වාර්තා අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20(4)(ආ) වගන්තිය යටතේ රුහුණු විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙනුවට 2025 පෙබරවාරි 25 දින සිට බලපැවැත්වෙන පරිදි නිසි බලධරයා වශයෙන් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ආර්. එම්. යූ. එස්. කේ. රත්නායක මහතා පත්කිරීම සම්බන්ධයෙන් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් සාදන ලදුව, 2025 පෙබරවාරි 24 දිනැති අංක 2425/03 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය ඉදිරිපත් කරන ලදී.

එම ලිපිලේඛනය, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(6) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2022 වර්ෂය සඳහා ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2021/2022 වර්ෂය සඳහා සීමාසහිත ලංකා පොහොර සමාගමේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(9) වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යවරයා විසින් 2022 වර්ෂය සඳහා පොල් වගාකිරීමේ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(10) වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(11) නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් හි වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) (i) වස්කඩුව, කුඩා වස්කඩුව, ගාලු පාර යන ලිපිනයෙහි පදිංචි ඒ. ටී. බී. ද සිල්වා මහතාගෙන් ලැබුණු 2025.01.24 දිනැති පෙත්සම;

(ii) වැලිපැන්න, හිජරා වත්ත, අංක 88/ඩී දරන ස්ථානයෙහි පදිංචි එච්. එෆ්. එෆ්. ෆස්මියා මහත්මියගෙන් ලැබුණු 2025.01.22 දිනැති පෙත්සම; සහ

(iii) මත්තේගොඩ, මත්තේගොඩ පාර, 'සම්පත් උයන', අංක 9/1 දරන ස්ථානයෙහි පදිංචි සුනිල් විතාන ආරච්චි මහතාගෙන් ලැබුණු 2025.01.24 දිනැති පෙත්සම

ගරු අජිත් පී. පෙරේරා මහතා විසින් පිළිගන්වන ලදී.

(2) හිඹුටාන, ජයන්ති මාවත, අංක 276/4 ඩී දරන ස්ථානයෙහි පදිංචි ඕ. එම්. ඩී. ගැමුණු මහතාගෙන් ලැබුණු 2025.02.05 දිනැති පෙත්සම ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා විසින් පිළිගන්වන ලදී.

(3) බලපිටිය, දුම්රියපොළ පාර, අංක 65 දරන ස්ථානයෙහි පදිංචි පී. යූ. පී කුමාර ද සිල්වා මහතාගෙන් ලැබුණු 2024.12.13 දිනැති පෙත්සම ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා විසින් පිළිගන්වන ලදී.

(4) (i) මහරගම, පිළියන්දල පාර, නුග ගහ පෙදෙස, අංක 39/43 දරන ස්ථානයෙහි පදිංචි ජී. පී. එච්. විජයසේන මහතාගෙන් ලැබුණු 2025.02.10 දිනැති පෙත්සම;

(ii) පිළියන්දල, වැවල, ගංගාරාම පාර, අංක 2/1 ඒ දරන ස්ථානයෙහි පදිංචි ජී. සමන්ති ද සිල්වා මෙනෙවියගෙන් ලැබුණු 2024.12.30 දිනැති පෙත්සම; සහ

(iii) තලංගම, දකුණු තලංගම, අංක 613/ඒ දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. ශීලා කාන්ති මහත්මියගෙන් ලැබුණු 2025.02.07 දිනැති පෙත්සම

ගරු දේවානන්ද සුරවීර මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**4. පාර්ලිමේන්තුවේ වැඩකටයුතු:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ විෂය අංක 1, 2, 3, 4, 5 සහ 6 පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 24(2) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**5. වරප්‍රසාද:** ගරු ගයන්ත කරුණාතිලක මහතා, ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු චාමර සම්පත් දසනායක මහතා විසින් තමාගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2025 මාර්තු 18 දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය:** ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා, ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"මාබොටුවන ශ්‍රී පියරතන නාහිමි සුවසෙවන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතක්"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ඒ අනුව, පනත් කෙටුම්පත පළමුවැනිවර කියවා මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52(6) අනුව වාර්තා කිරීම සඳහා පනත් කෙටුම්පත සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා වෙත යොමු කරන ලදී.

(පූ.භා. 11.19ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

**7. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියෝජනය කරන මහජන නියෝජිතයින්, හිටපු රාජ්‍ය නායකයන් හා එම වැන්දඹුවන් භුක්ති විඳින වරප්‍රසාද සුදුසු පරිදි කප්පාදු කිරීම:** ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා ගරු සුරංග රත්නායක මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියෝජනය කරන මහජන නියෝජිතයින්, හිටපු රාජ්‍ය නායකයන් හා එම වැන්දඹුවන් භුක්ති විඳින වරප්‍රසාද පිළිබඳව මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයන් හි මෙන්ම මෙරට ජන සමාජය තුළ කථිකාවක් ඇති වී තිබෙන හෙයින්, රටේ පොදු ජනතාවගේ ඉල්ලීමට සවන්දෙමින් ඔවුන්ගේ අපේක්ෂාවන් සඵල කිරීම පිණිස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට, හිටපු රාජ්‍ය නායකයන්ට හා එම වැන්දඹුවන්ට චිරාත් කාලයක් ලබා දී තිබූ වරප්‍රසාද සුදුසු පරිදි අඩු කිරීම, ඉවත් කිරීම හෝ ඒ වෙනුවෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා පාර්ලිමේන්තුවේ පක්ෂ විපක්ෂ සියලුම මන්ත්‍රීවරයන්ගෙන් සාධාරණ පිළිතුරක් පාර්ලිමේන්තු සභාව තුළ දී සාකච්ඡා කොට ලබා ගැනීමට රජය විසින් අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 2/2024

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීම සහ බෙදා හැරීම සඳහා රාජ්‍ය අංශයේ මැදිහත්වීම ඉහළ නැංවීමේ වැඩසටහනක් සකස් කිරීම:** ගරු රෝහණ බංඩාර මහතා ගරු චමින්ද විජේසිරි මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— ශ්‍රී ලංකාවේ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය, ඖෂධ හා වෙනත් ද්‍රව්‍ය ආනයනය කිරීමේ ක්‍රියාවලිය පුද්ගලයන් කිහිපදෙනෙකු අත රඳා පැවතීම නිසා ජනතාවට විවිධ අසීරුතාවයන්ට මුහුණදීමට සිදුවී තිබෙන හෙයින් මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා රාජ්‍ය අංශයේ මැදිහත්වීම ඉහළ නැංවීමට සුදුසු වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 12/2024

(අ.භා. 1.00ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. විගණන වාර්තා මඟින් ලබා දෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම:** ගරු චමින්ද විජේසිරි මහතා ගරු මුජිබුර් රහුමාන් මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— රජයේ විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතනවල සිදුවන විවිධ මූල්‍යමය වංචා පිළිබඳව විගණන වාර්තා මඟින් කරුණු හෙළි කරන හෙයින්, එවැනි වංචා හා දූෂණ රාජ්‍ය ආයතනවල සිදුවීම වැළැක්වීම සඳහා එම වාර්තා මඟින් ලබා දෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීමට වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 19/2024

(අ.භා. 1.58ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරිය මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**10. ශ්‍රී ලංකාවේ සෑම පවුලකටම ජීවත්වීමට නිවසක් ලබා දීම:** ගරු රවී කරුණානායක මහතා ගරු ජේ.සී. අලවතුවල මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— ශ්‍රී ලංකාවේ සෑම පවුලකටම ජීවත් වීමට නිවසක් හිමි විය යුතු වන බැවින්, සෑම ගෘහමූලිකයෙකු හටම තම ආරක්ෂාව සහ යහ පැවැත්ම උදෙසා නිවසක් මිලදී ගැනීම, ඉදිකිරීම හෝ කුලියට ගැනීම සඳහා සවිබල ගන්වමින් ඔහු හෝ ඇය හට පහසුකම් සැලැස්විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 25/2024

"ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය මූලාසනාරූඪ විය යුතු ය"යි කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.06 ට ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**11. පොදු ප්‍රවාහන ප්‍රමිතීන්ට අනුකූල බස් රථ පමණක් මෙරටට ගෙන්වීමට අදාළ නීති සකස් කිරීම:** ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා, ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— ලංකා ගමනාගමන මණ්ඩලයේ මෙන්ම පෞද්ගලික අංශයේ බස් රථ මගී ප්‍රවාහනය සඳහා සුදුසු තත්ත්වයක නොපවතින හෙයින්ද, එම බස් රථවලින් අති බහුතරයක් ලොරි චැසි මත ඉදිකරන ලද ඒවා වන හෙයින්ද, අනාගතයේදී රාජ්‍ය අංශයට මෙන්ම පෞද්ගලික අංශයට බස් රථ ගෙන්වීමේදී මගී ප්‍රවාහනය සඳහා නිෂ්පාදිත, මගී සුවපහසුවට ගැලපෙන සහ පොදු ප්‍රවාහන ප්‍රමිතීන්ට අනුකූල බස් රථ පමණක් ශ්‍රී ලංකාවට ගෙන්වීමට අදාළ නීති රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 37/2025

"ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 4.06ට ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**12. "සංවර්ධන යෝජනා" නමින් ශ්‍රී ලංකාව තුළ මේ දක්වා ඉදිකර ඇති එහෙත් කිසිදු ප්‍රයෝජනයකට නොගන්නා ලද සියලුම ගොඩනැගිලි මහජන ප්‍රයෝජනය සඳහා යොදා ගැනීමට කටයුතු කිරීම:** ගරු ලාල් ප්‍රේමනාත් මහතා, ගරු නිශාන්ත පෙරේරා මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— විදේශ ආධාර හෝ විදේශ ණය මත හෝ මධ්‍යම රජයේ හෝ පළාත් පාලන ආයතනවල මුදල් වියදම් කොට "සංවර්ධන යෝජනා" නමින් රට පුරා ගොඩනැගිලි ඉදිකර ඇති හෙයින් මේ දක්වා ඉදිකොට ඇති, එහෙත් කිසිදු ප්‍රයෝජනයකට නොගන්නා එවැනි ගොඩනැගිලි මහජන ප්‍රයෝජනයට ගත හැකි තත්ත්වයකට ගොඩනැංවීමට රජය විසින් සුදුසු තීරණ ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 38/2025

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**13. කල් තැබීම:** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය"යි නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

එකල්හි වේලාව අ. භා. 5.30 වූයෙන්, මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

ඊට අනුකූලව, පාර්ලිමේන්තුව 2025 මැයි 20 අඟහරුවාදා පූ.භා. 9.30 වනතෙක් කල් තබන ලදී.